බෙදුම්වාදයක් ලෙස සලකා කොන්දේසි විරහිතව වහා තහනම් කිරීමට කටයුතු කළ යුතුය.

වර්ගවාදය, ආගමික බෙදුම්වාදය, ආගමික අන්තවාදය අන්‍යාගමීකරණය වැනි අනේකවිධ සතුරු බලවේගවලට එරෙහිව පොදු ජාතික ක්‍රියාකාරී සැලැස්මක් මෙහෙයවීම් සඳහා සියලු ජාතික බලවේගවල එකමුතුවෙන් ''ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානයක්'' පිහිටුවීමට මෙයින් යෝජනා කරමු.

**5) ජාතික උරුමයන් සුරැකීම**

වසර 2500 කට අධික ඉතිහාසයක් ඇති අප රටේ පුරාවිද්‍යාත්මක භූමි, ස්මාරක, වෙහෙර, විහාර විනාශ කිරීම හා එම භූමි අනවසරයෙන් අල්ලා ගැනීම කාලයක් තිස්සේ සිදු වෙමින් පවතී.

එමෙන් ම ඉතා පෞරාණික භාෂාවක් ලෙස ගෝලීයව ඉතා සුළු ප්‍රතිශතයක් පමණක් භාවිත කරන සිංහල භාෂාව හා සාහිත්‍යය විනාශ වීමේ තර්ජනයට ලක් වී ඇත. සිංහල භාෂාව හා සාහිත්‍යය, පුරාවිද්‍යා භූමි, ස්මාරක, ආදි ස්ථාන හඳුනාගෙන ජාතික උරුමයන් ලෙස නම් කළ යුතුය.

සංවිධානාත්මක ලෙස සිදුකරන ඉතිහාසය විකෘති කිරීම් සහ පුරාවිද්‍යාත්මක සාක්ෂි විනාශ කිරීම් සඳහා වැට බැඳීමට නව නීතිරීති ගෙන ආ යුතු අතර අපේ ජාතික උරුමයන් වන සිංහල භාෂාව සහ සාහිත්‍යය, හෙළ වෙදකම, සිංහල සිරිත් විරිත් ලෝක උරුමයන් ලෙස නම් කර සංරක්ෂණය කිරීම සඳහා පියවර ගත යුතුය.

**6) ශක්තිමත් දියුණු තිරසර ආර්ථිකයක්...**

වර්තමාන ආර්ථික ව්‍යුහය හා සමස්ත ආර්ථිකයේ හැසිරීම් තුළ සිංහලයාට ඇත්තේ ඉතා සීමිත ඉඩකඩකි. මෙම තත්ත්වයෙන් අප ජාතිය මුදා ගැනීම සඳහා සැලසුම් සහගත දිගුකාලීන ජාතික ප්‍රතිපත්ති රාමුවක් ගොඩනගාගත යුතුය.

බරපතල ශ්‍රම සහ වෙළෙඳ සූරාකෑමකට ලක්ව ඇති සිංහල ජාතිය එයින් මුදවා ගැනීම සඳහා කෘෂිකර්මයට නිසි ගෞරවය හා ආර්ථික ප්‍රතිලාභ ලැබෙන නව ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට අප පියවර ගත යුතුය.

ලෝකයේ දියුණු රටවලට නොදෙවෙනි දළ ජාතික නිෂ්පාදනයක්, ඒක පුද්ගල ආදායමක්, විදේශ සංචිත සහිත, විදේශ ණය අවම වූ ශක්තිමත් දියුණු තිරසර ආර්ථිකයක් ගොඩනැගීමට දේශීය ආර්ථිකය දියුණු කළ යුතුය.

රට තුළ ගෞරවනීය ලෙස ආදායම් ලැබිය හැකි රැකියා අවස්ථා නිර්මාණය කොට කාන්තාවන් විදේශ වහල් සේවයට යැවීම තහනම් කළ යුතුය..

දේශීය කෘෂිකර්මය, දේශීය කර්මාන්ත දියුණු කිරීම රටට හානියක් නොවන පරිදි විදේශ විනිමය, තාක්ෂණය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එදා වැව් බැඳි රාජ්‍යයේ සමෘද්ධිය නැවත ඇති කොට නව තොරතුරු තාක්ෂණයේ ප්‍රයෝජන ලබා වැව් බැඳි රාජ්‍යක් බද්ධ කළ යුතුය. ආර්ථිකය තුළ ජාතිවාදී හා ආගම්වාදී ක්‍රමවේද තහනම් කළ යුතුය.

**7) දේශප්‍රේමී අධ්‍යාපනයක්**

අපේ අධ්‍යාපන ක්‍රමය සූක්ෂම ලෙස ජාතියේ අනාගත පරපුර දුර්වල කිරීමේ ආකෘතියකට තල්ලු වෙමින් තිබේ. වත්මන් විකාරරූපී අධ්‍යාපන ක්‍රමය හරහා රටට ආදරේ කරන රටට වගකියන දරුවන් බිහිවීම හකුළුවන අතර හතු පිපෙන්නාක් මෙන් බිහිවෙන ජාත්‍යන්තර පාසල් මාෆියාව හරහා බහුතර සිංහල බෞද්ධ දරුවන් ඉතා අවාසිදායක අනාගතයකට තල්ලු කරවමින් තිබේ.

ඉංග්‍රිසි භාෂාව පිළිබඳ දැනුම ග්‍රාමීය පාසල්වල දරුවන් පසුගාමී ස්ථරයකට තල්ලු කරමින් තිබෙන අතර ඉංග්‍රීසි මාධ්‍ය පාසල් අධ්‍යාපනය තෝරාගත් පැලැන්තියකට පමණක් සීමා වෙමින් තිබේ.

බහුතර සිංහල දරුවන් මුහුණ දෙන මෙම අනාගත අවදානම අවම කිරීම් සඳහා ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසු ඉංග්‍රීසී මාධ්‍ය අධ්‍යාපනය සෑම පාසල් දරුවකුටම ලබාදිය හැකි පොදු ඉගැන්වීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.

රටට ආදරය කරනු ලබන, රටට වගකියනු ලබන, රට දියුණු කළ හැකි ගුණවත්, දැනුවත්, බලවත් පුරවැසියන් බිහි කිරීම උදෙසා ළදරු පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා සියලු ක්ෂේත්‍රවල පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතුය.

සෑම පුරවැසියකුටම උසස් අධ්‍යාපන අවස්ථා ලබා දිය යුතු අතර... ආගමික, ජනවාර්ගික පදනම මත පාසල් හා අධ්‍යාපන ආයතන පවත්වාගැනීම තහනම් කිරීමට යෝජනා කරමු.

පාසල්, විශ්වවිද්‍යාල ඇතුළු සියලු අධ්‍යාපන ආයතන තුළ ආගමික අන්තවාදයන් ප්‍රවර්ධනය කිරීම තහනම් කළ යුතුය.

**8) නිවාස යටිතල පහසුකම් ජනාවාසකරණය සහ ජනගහන කළමනාකරණය**

දැනට රජය අනුදැනුම සහිතව ද රහසේන් ද බහුතර සිංහල මවුවරුන් ඉලක්ක කරගෙන සිදුකරන වන්ද්‍යාකරණ ක්‍රියාකාරකම් වහා නවත්වන්නට පියවර ගත යුතුය. සියලු ජනකොටස් සඳහා එක ලෙස අදාළ වන පොදු ජනගහන පාලන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමටත් බලහත්කාරී සහ කුමන්ත්‍රණකාරී ලෙස සිදුකරන වන්ද්‍යාකරණයට එරෙහිව දැඩි නීති රීති පනවා ක්‍රියාත්මක කළ යුතුය.

ජාතිවාදී පදනමකින් සැලසුම් සහගතව සිදුකරන ජනසංයුති වෙනස්කිරීමේ ක්‍රියාකාරකම් ජාතික ප්‍රතිපත්ති රාමුවක් හරහා කළමනාකරණය කළ යුතුය. උතුරු නැගෙනහිර වාර්ගික යුද්ධයේදී සහ ඉන් අනතුරුව සිදු වූ වාර්ගික වශයෙන් භූමිය අල්ලාගැනීම, වාර්ගික ප්‍රදේශ නිර්මාණය කිරීම, සිදුකරන ජනාවාසකරණය, වාර්ගික පරිපාලන ව්‍යුහයන් බිහිකිරීම වහා නතර කිරීමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කළ යුතුය.

රටේ භූමි ප්‍රමාණය සහ ස්වභාවික සම්පත්වල සීමාවන් හඳුනාගෙන, ජාතික නිවාස, නගර සැලසුම් සහ ජනාවාසකරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය.

මෙහිදී සෑම පුරවැසියකුටම නිවාසයක් ලබාගැනීමට ඇති අයිතිය තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.

**9) සෞඛ්‍ය සහ පෝෂණය**

නිරෝගී මිනිස් පරපුරක් බිහි කිරීම රාජ්‍යයේ ප්‍රමුඛ වගකීමක් ලෙස හඳුනාගෙන ඒ සඳහා පුළුල් ජාතික ප්‍රතිපත්තියක් මත පිහිටා කටයුතු කළ යුතුය.

අද අප ජාතිය මුහුණදෙන දියවැඩියාව, වකුගඩු රෝගය, පිළිකා වැනි රෝගාබාධයන් හරහා දුර්වල රෝගී වූ ජාතියක් නිර්මාණය වීම වැළැක්වීමට මෙම ජාතික ව්‍යසනයෙන් අප ජාතිය මුදාගැනීම සඳහා වූ පුළුල් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාවට නැංවිය යුතුය.

සියලු පුරවැසියන්ට ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් ලබාදීම මූලික අයිතිවාසිකමක් ලෙස සැලකිය යුතු අතර යම් රෝගයක් සඳහා අප රටේ අවශ්‍ය ප්‍රතිකාර පහසුකම් නොමැති අවස්ථාවලදී විදේශ රටවල සෞඛ්‍ය පහසුකම් හරහා හෝ නිසි ප්‍රතිකාර ලබාදීම රජයේ වගකීමක් ලෙස සැලකිය යුතුය. මෙම පහසුකම් සියලු පුරවැසියන්ට හිමි අයිතිවාසිකමක් ලෙස තහවුරු කළ යුතුය.

හලාල් වැනි ආගමික ආහාර සහතිකකරණයන් සිංහල ජනතාව වෙත බලෙන් පැටවීම වළක්වා එය එම ආගමික සහතිකකරණය අවශ්‍ය ජනකොටස් සඳහා පමණක් සීමා කළ යුතුය.

දේශීය සිංහල වෙදකම, ආයුර්වේදය හා බටහිර යන සෞඛ්‍ය ක්‍රමවේද සංකලනයෙන් දියුණු කරන ලද ජනතාවට හිතකර සෞඛ්‍ය හා පෝෂණ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කොට ජනතාවගේ ගුණාත්මක ආයු කාලය වැඩි කිරීම කටයුතු කළ යුතුය.

මෙවන් යෝජනාවලියක අවශ්‍යතාවය රටට දැනෙමින් පවතින්නේය. මෙවන්ම වූ යෝජනාවලියක් සහ ප්‍රතිපත්ති ප්‍රකාශයක් බොදුබල සේනාවෙන් පමණක් නොව අස්ගිරි මල්වතු ඇතුළු තෛලෙනිකායික මහා සංඝරත්නය විසින්ද ඉකුත් දා සම්පාදනය කරනු ලැබිණි. එපමණක් ද නොව ''අපි ජාතික බලවේගය'' මගින් ද රටේ ජනගහන සමාජයීය ආර්ථික දේපල සහ ඉඩම් දේශපාලන අංශ සඳහා අවශ්‍ය විසඳුම් යෝජනා කළහ. සෙසු විවිධ සංඝ සභා ඔස්සේ ද රටට දැයට, ජාතියට ආගමට හිතැති විසඳුම් ගෙනැවිත් ඇත්තේය. දැන් සිදුවිය යුත්තේ මේ සියල්ලෝම එකට එකතුව එක මතයකට පැමිණීමය.

එවිට එක් දර කෝටුවකට වඩා දර කෝටු රැසක් එක්කොට බැඳි දරමිටියේ ශක්තිය ලොවටම පෙන්විය හැකි වන්නේය.

# අම්මගෙ අත් නොහරින උත්සාහය

කුඩා තෝමස් ඉගෙන ගන්නා පාසලේ විදුහල්පතිවරයා ඔහු අත තෝමස්ගේ මවට ලිපියක් යවනවා. මව එම ලිපිය විවෘත කොට තෝමස්ට ද ඇසෙන ලෙස කියවනවා. ඔබගේ දරුවා ඉතාමත්ම දක්ෂයෙක්. ඔහුගේ බුද්ධියට සරිලන පරිදි ඉගැන්වීමට අප පාසලේ ප්‍රමාණවත් ගුරුවරු සහ පහසුකම් නැහැ. ඒ නිසා දරුවා ගෙදර තබාගෙන ඔබම උගන්වන්න. ඉන්පසු අම්මා දරුවා පාසල් යවන්නේ නැහැ. නිවසේදීම දරුවාට උගන්වනවා. ග්‍රැමෆෝනය විදුලි බල්බය ඇතුළු නව නිපැයුම් සියගණනක හිමිකරුවා වූ තෝමස් අල්වා එඩිසන් බිහිවන්නේ මේ අයුරින්. පසු කලෙක තෝමස්ගේ මව මියගියා. ඇයගේ කාමරය අස්පස් කරන තෝමස්ට ඇගේ පැරණි දින පොතක තිබී එදා විදුහල්පතිවරයා තම මවට එවන ලද ලිපිය හමුවුණා. එහි ලියා තිබුණේ ඔබගේ දරුවා මන්දමානසික දරුවෙක් ඔහුට ඉගැන්වීමට පාසලේ ප්‍රමාණවත් පහසුකම් නෑ. ඒ විතරක් නෙමෙයි මේ දරුවාට ඉගැන්වීමෙන් පලක් වේයැයි මා සිතන්නේ නෑ කියා. කඳුළුවලින් බොඳ වූ තෝමස්ගේ දෙනෙත හැඳ සිටි කබායේ කෙළවරෙන් පිසදා ගත්තා.